# 4 අමුතු කතා

පින්තූර මගින් කතා කීම ඈත කාලයේ සිට පැවත එන ක්‍රමයකි. පින්තූර කතා කියවීමට අපි කැමැත්තෙමු. චිත්‍ර කතා යනු පින්තූර බහුලව භාවිත කරමින් ඉදිරිපත් කෙරෙන කතන්දර වර්ගයකි. ටින් ටින්ගේ වීර ක්‍රියා, ඇස්ටරික්ස් ආදිය ලෝකය පුරා අදත් ජනප්‍රිය චිත්‍ර කතා වේ. දිගු කතා ලෙස ද ඇතැම් විට ඉතා කුඩා කතා ලෙස ද චිත්‍ර කතා දැකිය හැකි ය. ළමා පුවත්පත්වල කොටස් වශයෙන් මෙන් ම තනි කථාංග වශයෙන් ද චිත්‍ර කතා පළ වෙයි.

බටකොළ ආච්චි, බූ බබා ආදි චරිත අපට හඳුන්වා දුන් එස්.ඒ. දිසානායක මහතාගේ චිත්‍ර කතා නිර්මාණ කිහිපයක් මේ පාඩමට ඇතුළත් වෙයි. එතුමාගේ චිත්‍ර කතා එකල ඉතා ජනප්‍රිය විය. ඔහු විසින් නිර්මාණය කරන ලද 'අමුතු කතා' පළ වූයේ තනි කථාංග වශයෙනි. එබඳු කථාංග තුනක් මෙහි ඉදිරිපත් කර ඇත.






එදා, අපි අඩි හත්දෙනා කෑදර වුණු කතාව ඉගෙන ගත්තා. අපි අද ඒක රඟපාමු!
හා මිස්!
එහෙම නම් දැන් ඔයගොල්ල සූදානම් වෙන්න!
හෝ!!!!!!!
හරි අපූරුවට ඔයගොල්ල නාට්‍යයට සූදානම් වෙලා! අතන හැබෑවටම වතුර හැළියකුත් ලිපේ!
මං තවතත් ඔයගොල්ලට මේ කතාවෙන් දෙන අවවාදය මතක් කරලා දෙන්නම්! කවදාවත් අනුන් රවටන එක හොඳ නෑ! නාට්‍යයි අවසන් වෙන්න ඕනෑ එහෙම!
දරුවනේ, හැළියෙ හැබෑවටම කැඳ උතුරනවානේ! ඒක වුණේ කොහොමද?
රවටන එක හොඳ නැහැනෙ මිස්...! මං හාල් මිටක් දැම්මා!
මාත් දැම්මා!
මාත්!
මාත්!
මාත්!
මාත්!
මාත් දැම්මා!





නොමිලේ බෙදා හැරීම සඳහා ය.


එන්න දුඹුරු පැත්තට! මේක වාහන යන පාර!
ඔයා නිකං යන්න! දන්න මිනිහා කොහොම ගියත් එකයි!
පාරේ නීතිය දන්න කෙනා යන්නෙ දුඹුරු පැත්තෙන්! ඒකෙ තේරුම වාහන එන්නෙ එම පැත්තෙන්!
ඔයා පණ්ඩිතයා! හැබැයි පණ්ඩිතයාට ඒ දන්නෙ යන්නත් බැරිලු! ඇයි කියනවා වැඩියෙන්?
මං කියන්නේ මේකයි; පාරේ දුඹුරු පැත්තෙන් ගමන් කරන කෙනාට තමා කිට්ටුවෙන් යන වාහන කල්තියා පේනවා! ඒ නිසා කල්තියා වාහනේට අවකාශ ඉඩ දීලා අයින් වෙන්න පුළුවනි!
වාහනේකට විශ්කානමක් තියෙන්නෙ එකට! අපි පැනලා ඉඩ දෙන්න ඕනෙ නෑ!
කිව්වා නාහන ගුරු ඉහළ ගියොත් ඉහළ, පහළ ගියොත් පහළ, කිව්වලු!
ඇති! ඇති!! යන්න පාර බලාගෙන!

## අවබෝධය

1. **පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට උත්තර දෙන්න.**

   i. සිසුන් රඟපෑමට සූදානම් වුණු කතාව කුමක් ද?

   ii. එම කතාවෙන් දෙන ආදර්ශය කුමක් ද?

   iii. බල්ලාට බත් දීමට ළමයාට අමතක වූයේ ඇයි?

   iv. පාඩමට අනුව 'පාරේ නීතිය' යනු කුමක් ද?

   v. පාරේ නීතිය අනුගමනය නොකළ ළමයාට සිදු වූයේ කුමක් ද?

## ක්‍රියාකාරකම 1

**ගුරුවරයාගේ සහාය ඇතිව ඊළඟ පිටුවේ දැක්වෙන චිත්‍ර කතාවේ හිස්තැන්වලට සුදුසු දෙබස් ගොඩ නගන්න.**




## ක්‍රියාකාරකම 2

ඔබත් තනිව හෝ යහළුවන් සමග එකතු වී චිත්‍ර කතා නිර්මාණය කරන්න.